7

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................ විභාග අංකය :- ....................

සැලකිය යුතුයි:
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට ඉතාම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) කිතුනු අපගේ පූජනීය ග්‍රන්ථය වන්නේ,
(1) උත්පත්ති පොතයි. (2) ශු.බයිබලයයි.
(3) ක්‍රියා පොතයි. (4) ගීතාවලියයි.

(02) දෙවියන් වහන්සේ විශ්වය හා මිනිසා මැවීම පිළිබඳ කතා පුවත ඇතුළත් වන්නේ,
(1) නික්මයාම පොතෙහි ය. (2) ගණන් කථාවෙහි ය.
(3) හිතෝපදේශයෙහි ය. (4) උත්පත්ති පොතෙහි ය.

(03) ජේසුස් වහන්සේගේ වංශාවලියෙන් ශුභාරංචිය ආරම්භ කර ඇත්තේ,
(1) ශු.ලූක් තුමාය. (2) ශු.ජොහන් තුමාය. (3) ශු.මතෙව් තුමාය. (4) ශු.මාක් තුමාය

(04) ශු.ජොහන් තුමාගේ ශුභාරංචියේ සංකේතය වන්නේ,
(1) රාජාලියා ය. (2) සිංහයා ය. (3) ගවයා ය. (4) මිනිසා ය.

(05) මැවීමේ පුවතට අනුව දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ,
(1) පළමු වන දිනයේදී ය. (2) සය වන දිනයේදී ය.
(3) තුන් වන දිනයේදී ය. (4) පස් වන දිනයේදී ය.

(06) 'නුඹලා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී පොළොව පුරා පැතිර එය යටත් කර ගන්න.' යනුවෙන් දෙවියන් වහන්සේ පැවසුවේ,
(1) ආදම් සහ ඒවටය. (2) ආබ්‍රහම් තුමාටය. (3) මෝසෙස් තුමාටය. (4) දේව ජනතාවටය.

(07)
A පැරණි ගිවිසුම
B සාම ගිවිසුම
C නව ගිවිසුම
D සීනයි ගිවිසුම

ඉශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේගේම ජනතාව ලෙස පිළිගනු ලැබුවේ...................... මගිනි.
හිස්තැනට අදාළ පිළිතුර වනුයේ,
(1) A ය (2) B ය (3) C ය (4) D ය

(08) දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ තමන්වහන්සේගේම.......................හා.................... ය. හිස්තැනට අදාළ පිළිතුර වනුයේ,

(1) කැමැත්ත හා බලයට (2) ආදරය හා කරුණාවට

(3) ස්වරූපය හා සමානකමට (4) ප්‍රේමය හා දයාවට

(09) 'මේ මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ කී වචනය ලෙස මට සිදුවේවා' යන වදන් පෙළ ඇතුළත් යාච්ඤාව වනුයේ,

(1) නමෝ මරිය (2) උදය ආරාධනාව

(3) තුන්කාලයේ ආරාධනාව (4) රාත්‍රී ආරාධනාව

(10)

A ඉතිහාසඥයෙකි

B වෛද්‍යවරයෙකි

C චිත්‍ර ශිල්පියෙකි

D ලේඛකයෙකි

ඉහත කරුණුවලින් ඔබට හඳුනාගත හැකි ශුභාරංචි කතුවරයා වන්නේ,

(1) ශු.ලූක් තුමාය (2) ශු. මතෙව් තුමාය (3) ශු.ජොහන් තුමාය (4) ශු.මාක් තුමාය

(11) ජේසුතුමා දොළොස් වියේ දී ජෙරුසලමේ දේව මාළිගයෙහි නතර වූයේ,

(1) තමා දේව පුත්‍රයා බව පෙන්වාදීමටය. (2) පඬිවරුන්ට දෙවි පියාණන් ගැන කියාදීමටය.

(3) ආගමික කටයුතුවල නිරතවීමටය. (4) පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමටය.

(12) ක්‍රිස්තුන් වහන්සේ විසින් අපෝස්තුළුවරුන්ට පවරන ලද දූත සේවාව නොකඩවාම ඉදිරියට ගෙන යනු ලබන්නේ,

(1) ප්‍රසාද ස්නාපනය මගිනි. (2) දිව්‍ය සත්ප්‍රසාදය මගිනි.

(3) අභිවෘද්ධි ආලේපය මගිනි. (4) පූජකවරය මගිනි.

(13) ඔබ යමෙකුගේ පව් කමා කරන්නහුද, ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ.............යනුවෙන් පවසමින් ජේසුස් වහන්සේ ස්ථාපිත කළේ,

(1) අභිවෘද්ධි ආලේපයයි. (2) සමගි සන්ධානයයි.

(3) රෝගීන්ගේ ආලේපයයි. (4) පූජකවරයයි.

(14) 'දරුවෙනි, සියලු කාරණාවලදී.............කීකරු වන්න. මන්ද ඔබ එසේ කිරීම ස්වාමින් වහන්සේට ප්‍රීතියකි. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) වැඩිහිටියන්ට (2) අසල්වැසියන්ට (3) දෙමව්පියන්ට (4) සහෝදරයින්ට

(15)

A ජලය

B පාස්කු ඉටිපහන

C ශුද්ධවූ තෛලය

D සුදු වස්ත්‍රය

ප්‍රසාද ස්නාපනයේ දී භාවිත වන සංකේත ඉහත දක්වේ. ඒවායින් ශුද්ධාත්ම වරම් ලැබීම සංකේතවත් කරනුයේ,

(1) A ය (2) B ය (3) C ය (4) D ය

(16) දෙව්පියාණන් වහන්සේට ප්‍රසන්න දරුවකු වීම සඳහා ඔබ කළ යුතු වඩාත්ම සුදුසු ක්‍රියාව වන්නේ,

(1) අසරණ අයට පිහිට වීමය.

(2) දේව වචනයට සවන් දීමය.

(3) නිතරම යාච්ඤා කිරීමය.

(4) සෑම දිනකදී ම ශුද්ධ ලෙස හා ධර්මිෂ්ඨ ලෙස ගත කිරීමය.

(17) 'ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා ........................ මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,

(1) කමා කරන්න.
(2) කරුණාව දක්වන්න.
(3) යාච්ඤා කරන්න.
(4) ආදරය දක්වන්න.

(18)

| ආරම්භක ප්‍රසාද නිධාන | ලැබෙන වරප්‍රසාද |
|---|---|
| 1. ප්‍රසාද ස්නාපනය | කිතුනු දිවියේ ආරම්භය |
| 2. ............................................. | පරිණත කිතුනුවකු වීම |
| 3. ............................................. | කිතුනු දිවිය සඳහා ආත්මිකව පෝෂණය වීම |

ඉහත වගුව අධ්‍යයනය කරන්න. මෙහි අංක 2 සහ 3 හිස්තැන් පිරවීම සඳහා අදාළ ප්‍රසාද නිධාන වන්නේ,

(1) අභිවෘද්ධි ආලේපය / දිව්‍ය සත්ප්‍රසාදය
(2) සමගි සන්ධානය / දිව්‍ය සත්ප්‍රසාදය
(3) පූජකවරය / රෝගීන්ගේ ආලේපය
(4) අභිවෘද්ධි ආලේපය / පූජකවරය

(19) අප යාච්ඤා කරන විට අන් අය හෙළා දැකීම නොකළ යුතු බව ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ...................... පිළිබඳ උපමාව මගින් ය.

(1) මැදියම් රැයේ පැමිණි මිත්‍රයා
(2) පරිසිවරයා සහ අයකැමියා
(3) අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා
(4) යහපත් සමාරියා

(20) ජේසුස් වහන්සේගේ ජීවිතයේ අනිවාර්ය අංගයක් වූයේ,

(1) යාච්ඤාවයි (2) බැහැපත්කමයි (3) ආදර්ශයයි (4) විශ්වාසයයි.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.

(01) 'දේව පනත් පිළිපදිමු' යන මාතෘකාව යටතේ ඔබ විසින් කරන ලද ඇගයීම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දෙවන දේව පනත ලියන්න. (ලකුණු 02)

(ii) තුන්වන දේව පනතින් ඔබට ලැබෙන පණිවුඩ 2ක් ලියන්න. (ලකුණු 04)

(iii) හතරවන දේව පනත අනුව අපගේ ගෞරවය හිමිවිය යුතු පුද්ගල කණ්ඩායම් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iv) හත්වන දේව පනත අනුව ඔබ විසින් නොකළ යුතු ක්‍රියාවන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(v) අටවන දේව පනත අනුව නොකළ යුතු ක්‍රියාවන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(02) (i) ශු.බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) පංච පුස්තකය හැඳින්වෙන වෙනත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ඔබගේ දේව ජීවිතය වර්ධනය කර ගැනීම සඳහා කළ යුතු දේවල් තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) මැවිල්ල පිළිබඳව දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පරිසරය සුරැකීමට පියවර නොගැනීමෙන් සිදුවන ස්වභාවික විපත් මොනවාද? කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) අප ජීවත්වන ලස්සන ලෝකය මවා දුන් දෙවිපියාණන්ට තුති පිදීමට යැදුමක් නිර්මාණය කරන්න. (ලකුණු 06)

(04) (i) දේව ප්‍රසාද නිධානයක ඇති ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමෙන් ආත්මිකව පෝෂණය වන ඔබ ජේසුස් වහන්සේට ආදරය දක්වන ආකාරය කරුණු තුනකින් ලියන්න. (ලකුණු 03)

(iii) කිතුනු පවුල තුළ දරුවන්ගේ යුතුකම් හා වගකීම් තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට ඔබට කළ හැකි කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) 'ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න' යන ජේසුස් වහන්සේගේ ඉගැන්වීම පාසල තුළදී ඔබ ක්‍රියාවට නංවන ආකාරය කරුණු තුනකින් විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) ජේසුස් වහන්සේ ළමා වියේ දී වර්ධනය වූ ආකාරය ගැන ශු.ලූක්තුමා සඳහන් කර ඇති කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ආධ්‍යාත්මිකව වර්ධනය වීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) පංතියේ සිටින අසරණ මිතුරකුට හෝ මිතුරියකට උදව් කිරීමට සිදුවුවහොත් ඔබ ක්‍රියා කරන ආකාරය කරුණු තුනකින් ලියන්න. (ලකුණු 06)

(07) (i) ස්වාමිවාක් ආරාධනාව අනුව යාච්ඤාවක ඇතුළත් විය යුතු ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ශුද්ධවන්තයන් අතර උසස්ම ගෞරවය හිමිවන්නේ මරිය තුමියටය. එබැවින් එතුමියට අපගේ ගෞරවය පුද කරන මාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 06)